35 වන පිටෙන්




එය විනාශ කළ සටන්කාමී සහෝදරියකට නායකතුමා තම දූරදර්ශන කණ්ණාඩිය තම පුද්ගලික තෑග්ගක් ලෙස ප්‍රධානය කළේය. ඊළඟට සිදු කෙරෙන විශාල ප්‍රහාර සඳහා වන සූදානම් වීමක් ලෙස මෙම විවේක කාලය සකස්ව ඇති බව අප කිසිවෙකු එම මොහොතේ දැන නොසිටියෙමු.

2000 වසරේ මාර්තු මස 26වන දින කුඩාරුප්පු ප්‍රදේශයට ගොඩ බැසීමේ ප්‍රහාරය සිදුකෙරුණි. අලිමංකඩ පසුකර ඉත්තාවිල් ප්‍රදේශයෙහි චතුරශ්‍රාකාර අයුරින් ප්‍රහාරක සැලැස්ම සේනාධිපති බාල්රාජ්ගේ නායකත්වයෙන් කොටින් විසින් සකස් කරන ලදි. මෙම ප්‍රහාරයේදී මාලතී බළකාය අලිමංකඩ ඉලක්ක කරගෙනද, මේජර්ගේ සොර්දියා බළකාය චාවකච්චේරිය ඉලක්ක කරගෙනද, චාල්ස් ඇන්තනී බළකාය ද ස්ථානගත කර තිබුණි. යාපනය සිට ඒ9 මාර්ගයෙන් අලිමංකඩ ඇති හමුදාවේ සැපයුම් මාර්ගය අවහිර කිරීම මෙහි අරමුණ විය. වඩමාරච්චි නැගෙනහිර තාලයෙඩි වීදිය අත්පත් කරගැනීමෙන් පසුව සේනාධිපති විදූෂා මට ඉත්තාවිල් ප්‍රදේශයට පැමිණෙන මෙන් දැනුම් දුන්නාය.

මම තවත් සටන්කාමී සහෝදරියන් කීපදෙනෙකු සමඟ කණ්ඩාවලෙල කොම්බඩි පාරෙන් අලිමංකඩ කලපුව පසුකර ගොස් එයට පසුව තොණ්ඩමනාරු කලපු ප්‍රදේශයෙහි ගමන් කරමින් උන්නෙමි. මෙවැනි කලපු ප්‍රදේශ තරණය කිරීමට මුහුදු කොටි සාමාන්‍ය 'බිලු ස්ටාර්' යාත්‍රා සහ අඩු අශ්වබල ධාරිතාවකින් යුත් යාත්‍රා භාවිතා කළෝය. තොණ්ඩමනාරු කලපුව පණ බේරාගෙන තරණය කිරීමට හැකිවීම සැලකුණේ මහත් භාග්‍යයක් ලෙසින්ය. කොටින්ගේ ස්ථාන ඉතාමත් කුඩා වපසරියක පිහිටි හෙයින් හමුදාවේ කාලතුවක්කු ප්‍රහාර විරාමයකින් තොරව එල්ල කරමින් පැවතිණි. අප ගමන් කළ යාත්‍රාවේ බර ආයුධ සහිත කණ්ඩායමක් ගමන් කරමින් උන්නේය. ඉතාමත් තියුණු ලෙසින් එල්ල වූ කාලතුවක්කු ප්‍රහාරයකින් අප ගමන් කළ යාත්‍රාවට ඉදිරියෙන් ගමන් කළ යාත්‍රාවේ ගමන් කළ සටන්කාමීන් මගේ දෑස් ඉදිරිපිට යාත්‍රාව සමඟ ගිනිගෙන මුහුදුබත් වූ මහත් වික්ෂිප්ත ජනක වූ ඛේදවාචකයක් එදින සිදුවිය. අපි කෙසේ හෝ පණ බේරාගෙන සෙන්පති විදූෂා සිටි ස්ථානයට ළඟා වූයෙමු.

තාවකාලිකව ඉදිකළ බංකරය මත ලී දඬු දමා පස් කොට්ට දමා තිබුණි. ඉහළ තරංග මාලා ධාරිතාවකින් යුතු දුරකථන සම්බන්ධතා උපකරණයෙන් ඇයගේ හඬ සවන් වැකුණු වහාම එම ස්ථානය දෙදරුම් කවමින් පස් කොට්ටා සහ ලී දඬු ගැලවී විසිරී යන්නට විය. ත්‍රාසජනක ඉංග්‍රීසි චිත්‍රපටියක වේගවත් දර්ශනයක් මෙන් ඉත්තාවිල් සටන්බිම කුරිරු යුද්ධයෙහි බිහිසුණු බිමක් විය. 2000 වසරේ අප්‍රේල් මස 22 වන දින කොටින් අලිමංකඩ අත්පත්කර ගැනීම සංවිධානයෙහි වසර ගණනක සිහිනයක් සැබෑවීමක් විය. එම ලවණ ජලය සහිත කලපු ප්‍රදේශයෙහි ඇති වූ සටනේ දී අහිමි වූ ජීවිත සංඛ්‍යාව දහස් ගණනකි.

අලිමංකඩ අත්පත් කර ගැනීමෙන් පසුව යාපනය සඳහා වන මාර්ගය විවෘත වූ බවට සංවිධානය අදහස් කළේය. ඊළඟට යාපනයත් අත්පත් කරගත යුතුය යන අරමුණින් පූනගරී සංගුපිටි මාර්ගය ඔස්සේ විශාල මෙහෙයුමක් දියත් කළේය. කොටින්ගේ දිගු දුර කාල තුවක්කුවල ශක්තිය මෙහි දී මුළුමනින්ම ප්‍රයෝජනයට ගත්හ. පූනගරියේ කල්මුනෙ නම් ස්ථානයේ සිට තෙන්මරාච්චි ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ හමුදා ස්ථාන වෙත කාල තුවක්කු ප්‍රහාර වැසි වසින්නට විය. හමුදාව ද දරුණු ප්‍රතිප්‍රහාර එල්ල කළේය.

කොටි සංවිධානයේ ප්‍රහාරක බළඇණි විසින් තෙන්මරාච්චියෙහි මරවන්පුලෝ වීදිය අත්පත් කරගන්නා ලදි. චාවකච්චේරි ප්‍රදේශය තම පාලනයට ගෙන ඒමට කොටින්ට හැකිවිය. දේශපාලන අංශ භාරකරු මා හට හදිසියෙන් සිදුකළ යුතු කාර්යයක් පැවරුවේය. එනම් වහාම සටන්කාමීන් සමඟ ගොස් එහි සිටින වැඩිහිටියන්ව බේරාගෙන වන්නියට කැඳවාගෙන ආ යුතුය යන වගකීමයි. එම වගකීම ඉටු කිරීම සඳහා සටන්කාමී සහෝදරයින්වත් එක්කර ගත්තෙමි.

මම සටන්කාමීන්ව සූදානම් කර සංගුපිටි මාර්ගයෙන් ඔවුන්ව යවමින් සිටියෙමි. ගුවන් හමුදාවේ ප්‍රහාර ඉතාමත් තියුණු අයුරින් එල්ල වෙමින් තිබුණි. පුනගරියෙහි වැලි පාරේ මගේ යතුරු පැදිය ධාවනය කිරීමට නොහැකිව මම එක් කකුලක් නොණ්ඩි ගසමින් අමාරුවෙන් යතුරු පැදිය තල්ලු කරමින් සිටියෙමි. වේගයෙන් එන ට්‍රැක්ටරයක හඬ මට පිටුපසින් ඇසුණේය. මඳක් ඉවත්වී එයට ඉඩ දීමට උත්සාහ කළ අවස්ථාවේ යතුරු පැදියේ රෝද නොකැරකී හිරවූ අතර මම පාර මැද්දේ යතුරු පැදිය සමඟ ඇද වැටුණෙමි. මට පිටුපසින් පැමිණි ට්‍රැක්ටරයෙහි රියදුරු එහි තිරිංග මත පා තබාගෙන නැගිට ගෙන සිටිනු මම දුටුවෙමි. පාලනයෙන් ගිලිහී ගිය ට්‍රැක්ටරයෙහි ඉදිරි රෝදය මගේ වම් උරහිස මතට නැගී තිබුණි. මමත් මගේ යතුරු පැදියත් එම ට්‍රැක්ටරයෙහිම පටවා ගෙන පැමිණි එම සටන්කාමීහු අපගේ පුනගරි කඳවුරට බාරදී පිටවී ගියහ.

එම ට්‍රැක්ටරයෙහි පටවා තිබූ මියගිය සටන්කාමී සහෝදර සහෝදරියන්ගේ මළ සිරුරුවලට මැද්දේ මම මහත් වේදනාවෙන් වැතිර උන්නෙමි. පසුව මම වේදනා නාශක බෙහෙත් පෙති කීපයක් බී අත වෙළුම්පටියකින් බැඳගෙන සංගුපිටි මාර්ගය ඔස්සේ කෛතඩි වැඩිහිටි නිවාසයට ගියෙමි. එම ස්ථානයට ඒ වන විට ගොස් සිටි අපේ සටන්කාමීහු අදාළ කටයුතුවල නිමග්නව උන්හ. දෑස්වලින් බැලීමට සිදුවිය නොයුතු ඛේදවාචකයක් එහි සිදුවී තිබුණි. තම ශක්තියෙන් නැගිටගෙන කටයුතු කළ නොහැකි වැඩිහිටියෝ බොහෝ දෙනෙක් ඇඳන් මතද, එම ගොඩනැගිල්ලේ වෙනත් ස්ථානවලද මියගොස් සිටියහ. බොහෝ දෙනෙක් තුවාල වී සිටි අතර ඉතිරිව සිටි අය බියෙන් ගැහෙමින් ලිප් බැම් යටද කාමරවලද සැඟව උන්හ. සිටින තැනම මළ මූත්‍ර කර තිබුණි. ලේ ගඳ ද, මළ සිරුරුවලින් එන ගඳ ද එකට එක්ව නාසය ආක්‍රමණය කරන්නට විය. දෙපාර්ශ්වය අතරෙහි ගැටුම් ඇතිවූ වහාම චාවකච්චේරි සහ කෛතඩි ප්‍රදේශයෙහි ජනතාව සියල්ල අතහැර වලිකාමම් ප්‍රදේශය කරා පලා ගියෝ ය. ශන්නියම් නමින් හැඳින්වෙන මෙම වැඩිහිටි නිවාසයෙහි භාරකරුවන් ද ආරක්ෂාව පතා පලා ගිය හෙයින් වැඩිහිටියෝ අත්හැර දැමූ තත්ත්වයට පත්ව උන්හ. දේශපාලන අංශයට අයත් දෙමළ පුනරුත්ථාපන සංගමය බෝට්ටු මාර්ගයෙන් මෙම වැඩිහිටියන්ව වන්නියට කැඳවා ගෙනැවිත් ආනෙවිලුන්දාන් ස්ථානයෙහි පිහිටි මහාදේව ආශ්‍රමයට භාර දී ඇත.

මාලතී බළකාය රැඳී සිටියේ නාවට්ටිකුලි හන්දිය පසුකර අරියාලෙල වීදිය බෙදෙන ස්ථානයෙහිය. මෙම ප්‍රහාරවලට මැදිවී ජනයා මහත් පීඩාවට පත්ව උන්නෝය. දෙපාර්ශ්වයෙහිම කාලතුවක්කු ප්‍රහාර හේතුවෙන් චාවකච්චේරි නගරය කුඩුපට්ටම් වී තිබුණි. කඩ සාප්පු විනාශ වී බඩු භාණ්ඩ පාරේ විසිරී තිබුණි.

ජනතාව වෙනුවෙන් වන විමුක්ති අරගලය මෙවැනි විනාශයක් ජනතාවට ඇති කරන්නේ ඇයි? යන පැනය හදවතේ ඇති වුවත් එම පැනය සිත් තුළට රැගෙන යා නොහැකි පරිදි යුදෝන්මාදය විමුක්ති කොටි සියල්ලම පාලය කරන්නට විය. චාවකච්චේරි සටනේදී සීමා ආරක්ෂා බළසෙ"නාවේ විසිපස් දෙනෙකුට වඩා ජීවිතක්ෂය පත්විය. එකම ගමේ වාසය කළ ඥාතීන් වූ ඔවුන්ගේ අහිමිවීම ජනතාව අතරෙහි මහත් කෝපයක් ඇති කිරීමට හේතු විය. එහි දේශපාලන කටයුතුවල යෙදී සිටි සටන්කාමීන් සමඟ ජනයා ගැටුම් ඇති කරගත් සිද්ධීන්ද විය.
සංවිධානය බලාපොරොත්තු වූ අයුරින් යාපනය දක්වා අඛණ්ඩව ඉදිරියට යාමට නොහැකි වූ හෙයි න් බළඇණි නැවතත් වන්නිය දක්වා පසුබැස්සෝය. 2001 වසරට පසුව කිලිනොච්චිය නගරය නැවතත් සශ්‍රික වන්නට විය. විමුක්ති කොටින්ද තම දේශපාලන සහ පරිපාලන ඒකක ආරක්ෂා කර ගැනීමෙහිලා දැක්වූ දැඩි උනන්දුව කිලිනොච්චි ආරක්ෂාව සම්බන්ධයෙන් සංවිධානය ආරම්භයේදී දැක්වූයේ නැත. සංවිධානයේ ප්‍රධාන මහලේකම් කාර්යාලය ඇතුළත්ව හමුදාමය ව්‍යුහයන් බොහොමයක් දිගටම පුදුකුඩියිරුප්පු ප්‍රදේශයෙහි පිහිටුවා තිබිණ. කිලිනොච්චියේ මහා ලේකම් කාර්යාලයත්, දේශපාලන විදුහලත් ඇති කළ අතර එම පරිශ්‍රය තුළම දේශපාලන අංශයේ කාන්තා පාර්ශ්වයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් පිහිටුවා ගත්තෙමු.

ප්‍රසිද්ධියේ දැනුම් නොදී තෙවන පාර්ශ්වයක මාර්ගයෙන් රහසිගතව ආණ්ඩුව සහ කොටි සංවිධානය අතරේ සාම සාකච්ඡාවක් සඳහා ආරම්භක කටයුතු සංවිධානය අභ්‍යන්තරයේ සිදු කෙරන බව දැනෙන්නට විය. එහෙත් ඒ වන විට කොටි සතුව තිබූ මිලිටරිමය ශක්තිය භාවිත කර යාපනයත් අත්පත් කරගත් පසුව සාකච්ඡාවකට යාම කොටි නායකත්වයේ කැමැත්ත විය. ඒ අතරම නැවතත් අලිමංකඩ අල්ලා ගෙන යාපනයේ ආරක්ෂාව ස්ථිර කරගැනීමෙන් පසුව සාම සාකච්ඡාවට පැමිණීම ලංකාවේ ආණ්ඩුවත් කැමැති වූවා විය හැකිය. එහෙයින් යාපනයේ ඇති මුහුමාලෙල සටන් පෙරමුණ දිගටම ගිණියම් වෙමින් පැවතිණ. 2001 වසරේ දී 'කිණිහිර' හමුදා ක්‍රියාන්විතය ක්‍රියාත්මක කළේය. එය කොටින් විසින් ජයග්‍රාහී ලෙසින් ව්‍යර්ථ කරන ලදි. එයට පසුව කිලිනොච්චි නගරය කොටින්ගේ දේශපාලන අගනගරය ලෙසින් ඉක්මනි න් ගොඩනැංවීය.

ජීවිත දහස් ගණනක රුධිරයෙන් නැහැවී ගිය ඒ9 මාර්ගය 2002 වසරේදී විවෘත කළ මොහොතේ කොටි සංවිධානය හමුදා ශක්තියෙන් උච්චස්ථානයෙහි සිටි බව කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. එම ශක්තිය දේශපාලනික සහ රාජ්‍ය තාන්ත්‍රික ශක්තියක් බවට පරිවර්ථනය කරන ක්‍රමෝපායයේදී කොටි සංවිධානයේ නායකත්වයට අත්වූ පරාජය පසු කලෙක මුල්ලවයික්කාල් වීදිය ජනතාව විවෘත කරගෙන පිටව යනු ලැබීමට හේතු විය.

**මතු සම්බන්ධයි**

**NAATI Translator**
Sinhalese/English
**සිංහල ඉංග්‍රීසි පරිවර්තන**
(Certificates/Documents for Visa matters)
**Nadie Kammallaweera**
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com

**JAPANESE**
By a qualified experienced teacher with proven results
**PREP to VCE**
- **Rapid Learning Strategies**
- **Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.**
- **Exam Revision and Preparation for VCE written and oral exam.**

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University), B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.
**Contact Number: 0425 396 975**